# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/89 - 2022 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා - 2022.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x) (අ)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන, ලියාපදිංචි අංක පී. වී. 66705 දරන කාවිසු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (කේ. අයි. යූ.) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද 2020 ඔක්තෝබර් මස 7 වැනි දින අංක 2196/40 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "හෙද පිළිබඳ දර්ශනපති" යන සටහනට හා එහි II වන තීරයේ ඊට අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### I වන උපලේඛනය

***කොන්දේසි***

1. කාවිසු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (කේ. අයි. යූ.) ආයතනය විසින් (එස්. එල්. කිවු. එෆ්. 6 වන ස්ථරයේ) මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව, පරිගණක ජාල සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව සහ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධි සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, පහත සඳහන් අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය. :-

IA - PG 5759 — 510 (2022/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂය ධාරාව යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් සමග නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුනු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා කාව්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (කේ. අයි. යූ.) ආයතනය හඳුනාගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම* |
|---|---|
| මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරුකරණය |
| පරිගණක ජාල සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී (ගෞරව) පරිගණක ජාල සහ සයිබර් ආරක්ෂාව |
| කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී (ගෞරව) කළමනාකරණ තොරතුරු පද්ධති |

**දිනේෂ් ගුණවර්ධන,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0661

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.